විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10.    மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10.    Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2009    දිනය / திகதி / Date 2009- 06- 12

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 12 /2009**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්,
දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,

## රාජකාරියේ යෙදී සිටියදී හදිසි අනතුරුවලට ලක්වීමෙන් ආබාධිත තත්වයට පත්වන රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම

2008- 12- 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 (IV), 1986- 10- 08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 386, 1993- 10- 01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 සහ 1988- 07- 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/88 යන විධිවිධානයන්ට අනුව විශ්‍රාම වැටුප සංශෝධනය සම්බන්ධව පහත සඳහන් උපදෙස් නිකුත් කරමි.

01. රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදී ක්‍රියාවන්ට ලක්වීමෙන් ආබාධිත තත්වයට පත්වන රාජ්‍ය නිලධාරීන්ට වයස අවු. 55 දක්වා වැටුප් ගෙවන්නේ නම් විශ්‍රාම වැටුප සංශෝධනය වේ.

   i. වයස අවු. 55 දක්වා ගෙවන ලද වැටුපෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකළ යුතුය.

   ii. වයස අවු. 55 සම්පූර්ණ වන දින හිමි වැටුප මත විශ්‍රාම වැටුප් අයදුම්පත/ සංශෝධන විශ්‍රාම වැටුප් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

   iii. වයස අවු. 55 සම්පූර්ණ වන දින තෙක් සේවා කාලය ගණන් ගත යුතුය.

   iv. පාරිතෝෂිකය ගෙවීමකින් තොරව වයස අවු. 55 දී ඉහත සඳහන් වැටුප හා සේවා කාලය මත විශ්‍රාම වැටුප් සකස් කොට ගෙවිය යුතුය.

   v. වෛද්‍ය හේතු මත විශ්‍රාම ගන්වා විශ්‍රාම වැටුපක් ගෙවනු ලබන්නේ නම් වයස අවු. 55 දී හිමි වැටුප හා සේවා කාලය මත එම විශ්‍රාම වැටුප (පාරිතෝෂිකයකින් තොරව) සංශෝධනය කළ යුතුය.

Telephone    Fax    Telephone    Fax

02. රාජකාරියේ යෙදී සිටියදී හදිසි අනතුරුවලට ලක්වීමෙන් පූර්ණ ආබාධිත තත්වයට පත්වන රාජ්‍ය නිලධාරීන්ගේ වයස අවු. 55 දක්වා වැටුප ගෙවන්නේ නම් විශ්‍රාම වැටුප් සංශෝධනය වේ. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 (iv) යටතේ විධිවිධාන සලසා ඇත)

i. එම වැටුපෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකළ යුතුය.

ii. වයස අවු. 55 දී නිලධාරියා ලබන වැටුප අනුව සහ වයස අවු. 55 දී සේවා කාලය අනුව විශ්‍රාම වැටුප සකස්කළ යුතුය. (පාරිතෝෂිකය ගෙවීමකින් තොරව විශ්‍රාම වැටුප ගෙවිය යුතුය)

iii. වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වා විශ්‍රාම වැටුප ගෙවනු ලබන්නේ නම් එය අවු. 55 දී හිමි වැටුප හා සේවා කාලය මත විශ්‍රාම වැටුප (පාරිතෝෂිකය ගෙවීමකින් තොරව) සංශෝධනය කළ යුතුය.

iv. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 346 හා 22/ 93 යටතේ විශේෂ වන්දි හා වන්දි විශ්‍රාම වැටුප් ගෙවා ඇත්නම් එම ප්‍රතිලාභ නැවත අයකළ යුතුය. මෙම අයකිරීම ගෙවිය යුතු හිඟ වැටුපෙන් අයකළ යුතුය. ගෙවනු ලැබූ විශේෂ වන්දි හා වන්දි විශ්‍රාම වැටුප විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විමසා දැනගත යුතුය.

03. රාජකාරියේ යෙදී සිටියදී හදිසි අනතුරුවලට ලක්වීමේදී පූර්ණ ආබාධිත තත්වයට වඩා අඩු ආබාධිත තත්වයට පත්වන නිලධාරීන්ට වයස අවු. 55 දක්වා වැටුප ගෙවීම හිමි නොවන බැවින් විශ්‍රාම වැටුප් සංශෝධන හිමි නොවේ.

04. මෙම චක්‍රලේඛ විධිවිධාන සන්නද්ධ හමුදා සාමාජිකයින්ට අදාල නොවන අතර, ඔවුන් සම්බන්ධව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/ 2009 විධිවිධාන ක්‍රියාත්මක විය යුතුය.

කේ .ඒ .තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

2. විගණකාධිපති